පළමුවැනි පලද වර්ධන ගම්මානය

කොළඹින් සැතපුම් 110 ක් තරම් ඈතින් පිහිටි කොත්මලේ අලංකාර කඳු මිටියාවතක පිහිටි විජයබාහු කන්ද ගම්මානයේ ඉතිහාසය නිවැරදි ලෙස දන්නා කෙනෙක් නැත්තෘෂේය.

යුද සංවිධානයට හෝ සතුරු ආක්‍රමණයනට බියෙන් හෝ ගම්මානයේ හරින වන රොද වල සැඟවී සිටි විජය බාහු නම් රජෙකු පිළිබඳ කථා පැරැන්නෝ සිහි කරති. සතුරු ආක්‍රමණික යන් පලවා හැර රට නිදහස් කළ රජ දරුවන්ට කොත්මලේ අභය භූමියක් වූ බව ඔවුහු උදම් අනති. කන්දෙහි අනිත් පැත්තේ දුටුගැමුණු රජු ඵලාර යුද්ධයට පෙර සිය පෙම්වතිය වූ කළු මැණිකා සමඟ සඛදනා පැවැත් වූ බව ජනකතා වලින් පැවසේ.

පසුගිය වසර ගෙවී යද්දී, එබදු රාජ කීයයන් සම්බන්ධ නොවූයේ නුමුදු, රාජකීය කාර්යයක් මෙම භූමියේ සිදු වූයේය. ඒ ශ්‍රී ලංකාවේ ඔටුනු නොපලන් රජ දරුවන් ගේ — ගොවීන්ගේ ජීවන තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ වැඩ පිළිවෙලකි.

කෘෂිකර්ම, ආහාර හා සමූපකාර ඇමති ගරු ලලිත් ඇතුලත්මුදලි මහතා විසින් පෙර රජ දරුවන් ගේ සිත් වගි කරවන අයස්කාන්ත දරු දැරියන් ගෙන් සමන්විත වන මෙම පිටිසර ගම්මානයෙහි පළමුවන කෘෂිකාර්මික පළදාවර්ධන ගම්මානය පිහිටුවීමට තීරණය කර ඇත්තේ ය.

ඇතුලත්මුදලි මහතා කිසිදු උත්සව යකින් තොරව හදිසියේ මෙම ගම්මා නයට පියනඟන විට, දුටුගැමුණු හා විජයබා රජ දරුවන් අමුත්තන් ලෙස සිටිය දී මෙම ගොවි බිමේ සේවය කළ පැරැන්නන් ගේ උරුමය හිමි කර ගත් ගොවින් සිය දෙනෙක් මලියදේව, පාසැලේ කුඩා ශාලාවට රැස්වී, විජය බාහුකන්ද කෘෂිකර්ම පළදා වර්ධන ග්‍රාමීය සමූපකාර සමිතියේ මූලික වැඩ කටයුතු කරමින් සිටියහ.

විජයබාහු කන්ද, කෝපි හා ගම්මිරිස් වගාවන් අතරින් අහසට නැගුණ කීතුල් ගස් රැසකින් අලංකාර වූව ගම් පියසකි. කොතරම් කීතුල් ගස් තිබුණත් ගම් වැසියන් මල් පැණියට ඇබ්බැහිවී නැතැයි පැරැන්නෝ ඇමතිවරයාට දන්වා සිටියහ.

එම ප්‍රකාශය, කීතුල් පැණි හා හකුරු අපනයනය කරනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට විජයබාහු කන්ද පත් කළ හැකි යැයි අපේක්ෂා වෙන් සිටින ඇමති වරයාට ලැබුන ධෛර්යයක් විය.

එම අදහසට පිටුබල දෙන තවත් ආධාරකයක් වෙයි. විජයබාහු කන්දට නුදුරුව. කොත්මලේ "සුවිස් කේප්" නිෂ්පාදන සමාගම පිහිටා ඇත. දැනටම සිය නිෂ්පාදනයන් මාලදිවයිනට එම සමාගම් යවන ගම්මානයේ නිෂ්පාදන ද එතෙර යැවීමට අපේක්ෂාවෙන් සිටී.

මෙම පළදාවර්ධන ගම්මාන ක්‍රියා වලිය මෙහෙයවනු ලබන්නේ කෘෂි කර්ම සංවර්ධන ඒකාරියයි. පසුගිය කාලයේ පාඩු ලබමින් සිටි සතොස ප්‍රධාන පෙළේ ලාභ ලබන ආයතනයක් බවට පත්කළ රසික් සාරුක් මහතා එම ආයතනයේ අධිපති වරයාය. විජය බාහු කන්දේ කෝපි හා ගම්මිරිස් නිෂ් පාදනයේ අනාගතය ගැන සාරුක් මහතා දැඩි විශ්වාසයක් පළ කරයි.



පළමුවන පළදා ගම්මානයේ අනාගත බලාපොරොත්තුව:
ගවයන් ඇති කිරීම

මෙම පළදාවර්ධන ගම් මාන ක්‍රියා වලියෙහි ඉතා වැදගත් අංගයක් වූයේ යුරෝ පිය ආර්ථික හවුලේ නියෝ ජිත කණ්ඩායමක් මෙම ගොවි මහතුන් හමුවීමයි. පළදා වර්ධන ගම්මාන වලට ආධාර උපකාරී වීමට පොරොන්දු වී සිටින මෙම නියෝජිතයන්ට එම සංක ල්පය හා ක්‍රියා කාරිත්වය එලෙසින්ම දැක ගැනීමට අවශ්‍ය විය.

ඔවුන් එන්නට මද වෙලා වකට පෙර, මෙම කුඩා පළදවර්ධන ගම්මානයේ සාමාජිකයින් සිය දෙනා කුඩා "ජනමත විචාරණය කට, සහභාගි වෙමින් සිටි යහ. ඒ දේශපාලනික මත විමසිකමට නොවේ.

විජයබාහු කන්ද

විජයබාහු කන්ද, කෝපි හා ගම්බිරිස් වගාවන් අතරින් අහසට නැගුනු කිතුල් ගස් රැසකින් අලංකාර වූ ගම්පියසකි. කොතරම් කිතුල් ගස් තිබුණත් ගම්වැසියන් මල් පැණියට ඇබ්බැහිවී නැතැයි පැරැන්නෝ ඇමතිවරයාට දන්වා සිටියහ.

එම ප්‍රකාශය කිතුල් පැණි හා හකුරු අපනයනය කරණු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට විජයබාහු කන්ද පත් කළ හැකි යැයි අපේක්ෂා වෙන් සිටින ඇමති වරයාට ලැබුන ධෛර්යයක් විය.

කොත්මලේ වැනි දුර බැහැර පලාතක වෙසෙන ජනතාව වුව ද ඉංග්‍රීසි බසෙහි වැදගත්කම අවබෝධ කරගෙන සිටිති. ඇතුලත්මුදලි මහතා ගේ වදන් ඔවුන් මතක් කරති–'' ඉංග්‍රීසි වැනි අන්තර් ජාතික බසක් ඔබ දන්නේ නම් අවස්ථා වලින් පිරුණු මාවතක් ඔබ සඳහා විවෘත වේ. නව විදුහරු දැනුම ඔබට ලබා ගත හැකි අතර එමගින් එතෙර රැකියාවක් හෝ ලබාගත හැකිය.

''ජනමත විචාරණය'' පැවැත් වුනේ කී දෙනෙකු ඉංග්‍රීසි බස ඉගෙනුමට කැමති ද යන්න දැනගනු සඳහාය. අමු වෙන් වැඩි හිටියන් සඳහා ද ඇතුව දරුවන් සඳහා ද රහස් ඡන්ද පවත්වන ලදී. වැඩි හිටියන් ගෙන් 93 දෙනෙකු ඉංග්‍රීසි ඉගෙනුමට පක්ෂවත් දෙදෙනෙකු විරුද්ධවත් ඡන්දය දී ඇත. දරුවන් ගෙන් 98 දෙනෙකුට ඉංග්‍රීසි අවැසි වූ අතර දෙදෙනෙකු 'එපා' කීහ.

ප්‍රෙමිල් රත්නායක
විසිනි.

බාධක කමකටොළු කොපරට්ටි තිබුනද පිටසර ගමක වුව ද ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය නිදැල්ලේ ගලායන ආකාරය දැකීම යුරෝපා ආර්ථික භවුල් නියෝජිතයකුට ප්‍රීති දායක විශ්මයක් විය

මත විචාරණයේ ප්‍රතිඵල නිකුත්වූ විට '' එය ශ්‍රේෂ්ඨ ප්‍රජාතන්ත්‍රික තීරණයක්'' ලෙස අතුලත්මුදලි මහතා ගේ ප්‍රසංශාවට ලක්විය.

මේ සමහම යුරෝපා ආර්ථික, භවුලේ නියෝජිතයකුට ද පුදුම වන සුළු අත් දැකීම් ලැබිණ. ඒ විජයබාහු කන්දේ ජනගහනය හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ඔවුන් ඇසූ ප්‍රශ්නවලට කාන්තාවන් දුන් පැහැදිලි පිළිතුරු නිසාය. වැඩි වශයෙන් දරුවන් ලබා විශාල පවුල් පරිපාලනය යෑමට තමන් කැමති නමුත් ඒ සමහම රටේ ආර්ථික තත්ත්වය ගැන ද සැලකිලිමත් වීමට අවශ්‍ය බව ඔවුහු නියෝජිතයනට කීහ. තුන්වන ලෝකයේ රටක ජනතාව තුළ ඇති දැනුමත් සුබවාදී ආකල්පයත් ගැන තමා පුදුමයට පත් වූ බව එක් නියෝජිතයෙකු ගේ අදහස විය.

'ශ්‍රී ලංකාව තුන්වන ලෝකයට අයත් වන්නේ රටේ ආදායමින් පමණි. වෙන කිසිම අංශයකින් එසේ වන්නේ නැතැයි,' ඇතුලත්මුදලි මහතා එයට පිලිතුරු වශයෙන් කීවේ ය.

ලෝකයේ තමා සතුට ඇති එකම සම්පත වන කෝපිගස් පහ කප්පාදු කිරීමට එක් අයසක ගොවි මහත්මෙක් එකඟ විය. මේ මගින් යුරෝපීය ආර්ථික භවුලේ නියෝජිතයනට විජයබාහු කන්ද පලදවර්ධන ගම්මානය පිළිබඳ වෙනත් සහතික අවශ්‍ය නොවිය.

ජුනි මාසයේ දී මෙම කෝපි පළදාව ලැබීම මෙන්ම මෙම ව්‍යාපාරයට යුරෝපීය ආර්ථික භවුලේ ආධාරය ලැබීම පිළිබඳව ද කෘෂිකර්ම සංවර්ධන අධිකාරියට කිසිදු සැකයක් නැත.

කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය ගව පාලනය ද මෙම ගමට හඳුන්වා දීමට අදහස් කරන බව පළවූ විට, හැම නිවස කම හරක් බානකට හා පැටියෙකුට වාසය කළ හැකි ගව ගාලක් සෑම නිවසකම හාමේ ඉදි කරන බව පෙනි කරුණකි. එමගින් ජීවවායු ඒකකයක් බැගින්ද පිහිටුවීමට ඔවුහු උත්සාහ කරති.

උගත් තරුණයන් ගොවිතැනට යොමු කළ හැකියි

(9 වෙනි පිටුවෙන්.....)

සමස්තයක් වශයෙන් වෙළඳ පොල සඳහා නිෂ්පාදනය වැඩි කිරීම සංකල්පයකි. නිෂ්පාදනය අලෙවිය කරා යා යුතුය. වෙසඟහා සුදුසු බෝග හා සක්ක්ව පාලන ව්‍යාපෘති තෝරා ගැනීමේ දී ප්‍රදේශයේ බාහිර ලක්ෂණ මෙන් ආර්ථික, ලක්ෂණ ද තේරුම් ගත යුතුය. අවසන් වශයෙන් වෙළඳ පොල බිඳ වැටීම් හා මිල උච්චාවචනයන් වලින් ගොවීන් ආරක්ෂා කළ යුතු බව අවධාරණය කළ යුතුය.

අවධානය යොමු කළ යුතු .....

(15 පිටුවෙන් ..)

ඉහතින් විස්තර කෙරුණු තත්ත්වයන් මත, මෙම යෝජිත කෘෂිකාර්මික සංවර්ධන උපාය මාර්ගය සාර්ථක කිරීම සඳහා අලෙඳිය, ණය හා කෘෂි රක්ෂණය සම්බන්ධිත ආධාරක සේවා අධ්‍යයන කර සවිමත් කළ යුතු බව ද නිතැතින්ම පෙනීයන්නේ ය.